## ස්ථාවර තැන්පතු

ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන සහ වලංගු හැඳුනුම්පතක් (ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රයක්) ඇති, වයස අවුරුදු 18ට වැඩි ඕනෑම අයෙකුට ස්ථාවර තැන්පතුවක් ඇරඹිය හැකිය.

- අවම තැන්පතුව රුපියල් 5,000 කි.
- තැන්පතු තනි තනිව හෝ හවුල්ව උපරිම වශයෙන් හිමිකරුවන් තිදෙනෙකුගෙන් ඇරඹිය හැක.
- පුද්ගලයන්, ආයතනික, සංගම්, භාර අරමුදල් හෝ පුණ්‍යායතන වලින් තැන්පතු පිළිගත හැක.
- මුදල්, බැංකු තැන්පතු හෝ චෙක්පත් මගින් තැන්පතු පිළිගනු ලබන අතර, චෙක්පත් සිංගර් ෆිනෑන්ස් (ලංකා) පි.එල්.සී නමින් "ගිණුම් හිමියාගේ ගිණුමට පමණයි" ලෙස රේඛනය කර ලබා දිය හැකිය.
- ඉල්ලුම්පත්‍රයේ නම් කරන ලද ගෙවන්නෙකුට පොලිය මාසිකව හෝ කල් පිරෙන විට ගෙවිය හැක.
- තැන්පතු කල්පිරීමට දින 7-14කට පෙර අලුත් කිරීමේ නිවේදනයක් ලැබෙනු ඇත. තැන්පතු සඳහා කිසියම් වෙනසක් සිදු කිරීම සඳහා, කල්පිරීමේ දිනට හෝ ඊට පෙර, උපදෙස් සහ අත්සන සමඟ අලුත් කිරීමේ නිවේදනය අප වෙත යොමු කිරීමට අවශ්‍ය වේ. එසේ කිරීමට අපොහොසත් වුවහොත්, පෙර උපදෙස් අනුව පවතින පොලී අනුපාත යටතේ එම කාලසීමාව සඳහා තැන්පතුව ස්වයංක්‍රීයව අලුත් වේ.
- තැන්පතු මුදල් ආපසු ගැනීම සඳහා තැන්පත්කරු තැන්පතු සහතිකය භාර දීමට අවශ්‍ය වනු ඇත.
- ස්ථාවර තැන්පතු කල් පිරෙන දිනට පෙර ආපසු ලබාගත නොහැක. කෙසේ වෙතත්, කල්පිරීමට පෙර තැන්පතු හෝ එහි යම් කොටසක් ආපසු ලබා ගැනීමකදී, තැන්පතු කාලසීමාව අනුව පොලී අඩු කිරීමක් සිදු කෙරේ. තැන්පත්කරුවෙකුට දැනටමත් ගෙවා ඇති ඕනෑම අතිරික්ත පොලියක් සමාගම විසින් ආපසු අයකර ගනු ලැබේ. එබැවින් එම අතිරික්ත ගෙවීම තැන්පතු මුදලින් අඩු කිරීමට සමාගමට හිමිකම් ඇත.

කල් පිරෙන දිනට පෙර මුදල් ආපසු ලබා ගැනීමකදී, දෙනු ලබන පොලී අනුපාතය පහත පරිදි වේ. මෙම පොලී අනුපාතය වෙනස් කිරීමට සමාගමට අයිතිය ඇත.

දින 0 – 29 - පොලියක් නොමැත
දින 30 – 179 - 2.5%
දින 180 සහ ඊට වැඩි - 3.5%

*කල් පිරෙන දිනට පෙර මුදල් ආපසු ලබා ගැනීමකදී, මාසයක් සඳහා තැන්පත් කරන ලද තැන්පතු සඳහා පොලී ගෙවනු නොලැබේ.

- පොලී ආදායම් මුදල්, ගෙවන්නාගේ නමින් චෙක්පතකින් හෝ නම් කරන ලද බැංකු ගිණුමකට බැර කල හැකි අතර, ඒ සඳහා කිසිදු අතිරේක ගාස්තුවක් අය නොකරේ.
- තැන්පතුකරුවන්ට තම ස්ථාවර තැන්පතු වටිනාකමෙන් උපරිම වශයෙන් 75% (පොලිය මාසිකව ගෙවන්නේ නම්) හෝ 80% (කල්පිරීමේදී පොලිය ගෙවන්නේ නම්) දක්වා තාවකාලික ආපසු ගෙවීම් (ණය) ලබා ගත හැකිය. එවැනි ආපසු ගෙවීම් තැන්පතු සඳහා අදාළ වන පොලී අනුපාතයට වඩා වසරකට 5%ක සියල්ල ඇතුළත් සේවා ගාස්තුවකට යටත් වේ. මෙම පහසුකම කළමනාකාරිත්වයේ අභිමතය පරිදි ලබාදෙන අතර, ඕනෑම වේලාවක තාවකාලික ආපසු ගෙවීම් සඳහා අය කරන සේවා ගාස්තුව වෙනස් කිරීමට සමාගමට අයිතිය ඇත. මෙම පහසුකම සඳහා ඇපකරය ලෙස තැන්පතු සහතිකය ආයතනය සතුව තබා ගන්නා අතර, මෙම පහසුකම් වලට අදාල තොරතුරු, නියමයන් සහ

කොන්දේසි කලින් කලට වෙනස් වීමට යටත් විය හැකි බැවින් නවතම තොරතුරු, පවතින නියමයන් සහ කොන්දේසි දැන ගැනීම සඳහා ප්‍රධාන ශාඛාවේ තැන්පතු අංශය හෝ ඔබට ළඟම ඇති ශාඛාව සම්බන්ධ කර ගැනීම සුදුසු වේ.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් එක් තැන්පත්කරුවෙකු සඳහා උපරිම වශයෙන් රුපියල් 1,100,000ක් දක්වා වන්දි ගෙවීම සඳහා, ස්ථාවර තැන්පතු රක්ෂණය කර ඇත.

- 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතට අනුව, උපරිම වසර 10ක් දක්වා ගනුදෙනු හෝ ලිපි හුවමාරුවක් නොමැති තැන්පතු අක්‍රිය ලෙස සලකුණු කර පසුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරනු ලැබේ.

- අනවසර ගනුදෙනු හෝ වැරදීමකින් සිදු වූ ගනුදෙනු හඳුනා ගත් විට, අප ද්විත්ව පාලන යාන්ත්‍රණයක් තුලින් එය නිවැරදි කරනු ලැබේ.

- තැන්පතුවට අදාල මුල් සහතිකය අස්ථාන ගත වුවහොත් ඒ පිළිබඳව වහාම සමාගමට දැනුම් දිය යුතුය. නව සහතිකයක් නිකුත් කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් සමාගමට ලබා දිය යුතුය.

- මෙහි දක්වා ඇති පොලී අනුපාත අනුව මසක කාලයක සිට වසර 5 දක්වා මුදල් තැන්පතු කළ හැකිය. ස්ථාවර තැන්පතු පොලී අනුපාත

ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීම සඳහා පහත ලිපි ලේඛන නිසි පරිදි පුරවා ළඟම ඇති ශාඛාව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. අවශ්‍ය නම් මෙම සබැඳියෙන් බාගත කළ හැක.

**තනි පුද්ගල/ හවුල්**

- ස්ථාවර තැන්පතු අයදුම් පත්‍රය
- ගනුදෙනුකරු පිළිබඳ දැන ගැනීමේ පෝරමය (KYC)
- FATCA පෝරමය
- ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ/රියදුරු බලපත්‍රයේ පිටපතක්
- ලිපිනය තහවුරු කිරීම සඳහා ලේඛන (අවශ්‍ය නම්)
- නාමිකයන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ ලේඛන (අවශ්‍ය නම්)

**ආයතනික**

- ස්ථාවර තැන්පතු අයදුම් පත්‍රය
- ආයතනය පිළිබඳ දැන ගැනීමේ පෝරමය (KYC)
- FATCA පෝරමය
- ව්‍යාපාර ලියාපදිංචිය/සංස්ථාගත කිරීමේ සහතිකය
- සමාගම් ව්‍යවස්ථාව
- අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනාව
- ප්‍රතිලාභී හිමිකාරිත්වයේ ප්‍රකාශය
- අධ්‍යක්ෂකවරුන් පිළිබඳ දැන ගැනීමේ පෝරමය (KYC)
- අධ්‍යක්ෂකවරුන්ගේ ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ/රියදුරු බලපත්‍රයේ පිටපතක්
- බලයලත් අත්සන්කරුවන් තහවුරු කිරීමේ ලිපිය
- බලයලත් අත්සන්කරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ/ රියදුරු බලපත්‍රයේ පිටපතක්

- පෝරමය 20
- පෝරමය 13 (සමාගමේ ලිපිනය වෙනස්වී ඇත්නම්)

**ආයතනය පිලිබදව ඔබට ඇති පැමිණිලි හෝ යෝජනා මෙතැනින් ඉදිරිපත් කළ හැකිය.**

**ආයතන්යේ පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය ඔබට අවශ්‍ය වේ නම් මෙම සබැඳියෙන් බාගත කළ හැක.**